# ජල පාලනයේ අනුසස්

## යළි පිබිදෙන වළගම්බාහුව

අලි කොටි වග වලසුන්ගෙන් ගහණ වනයෙන් වටවූ වළගම්බාහුව වියළි කලාපයේ පුරාණ වැව් ගමකි. වැවේ ජලය පාලනයක් අනුව බෙද හරිමින්, නව ගොවිතැන් ක්‍රමද හඳුන්වා දීම නිසා වළගම්බාහුවේ ගොවියන්ට දැන් නවෝදයක් උදවී ඇත.

- **"ආදි කාලේ රජ දරුවෝ කියාපු අන්දමට වැවේ වතුර අපේ ධනය කියන එක ගොවියන්ට ඒත්තු ගැන්විලා තියෙනවා"**
- **"ඉස්සර මඩාර පණුවන් ගහන කොට දලුක් අතු ගෙනවිත් වක්කඩවල දමනවා. දැන් කෘමි නාශක වර්ග ඉහිනවා"**
- **"වලගම්බාහු කුඹුරේ වැඩෙන ගොයම තියෙන එක හරියටම ගෙදර වී තියෙනවා වාගේ"**

වැව් ආශ්‍රිත වාරිමාර්ග ඉංජිනේරු කර්මාන්තය අතින් සිරිලක එද ලොව ඉහළින් ම සිටියේ ය. එනමුදු සතුරු ආක්‍රමණ නිසා පරාක්‍රම සමුද්‍රය, කලාවැව බඳු මහ වැව් නටබුන් වී යද්දී රජ රට වාසී ජනතාවට යළි පණ නළ පිඹ සිංහල සංස්කෘතිය රැක ගත්තේ වියළි කලාපය පුරා විසිරී තිබූ දහස් සංඛ්‍යාත ගම් වැව් සමූහය යි. කාලාන්තරයක් තිස්සේ විකාශනය වූ මේ වැව් සංඛ්‍යාව කොපමණ දැයි කිව නොහැක. මෙයින් දැනට නටබුන් වී නොමැති වැව් සංඛ්‍යාව 13,000 ක් පමණ වෙතැයි ගණන් බලා තිබේ. මේ වැව් සමූහය පුනරුත්ථාපනය කරවා ගම් මට්ටමින් ආර්ථිකය සරු සාර කිරීම රජයේ අධිෂ්ඨානය වී ඇත.

දැනට, මෙරට වාරිමාර්ග ජලය සැපයෙන කුඹුරු ප්‍රමාණය අක්කර දශ ලක්ෂයකට සවල්පයක් වැඩි ය. ඉන් හතරෙන් පංගුවක් ඉහත සඳහන් කුඩා වැව් යටතේ වගා කෙරෙන ඒවාය. මේ අනුව, කුඹුරු අක්කර 2,50,000 කට පමණ සුළු වැව් වලින් ගොවිතැන් උදෙසා දැනට ජලය සැපයේ.

ජනගහනය වැඩි වී යාමත් සමඟ ම ගමේ වැව යටතේ වූ කුඹුරු කැබලිව ගොස් සෑහෙන ජීවිතයක් ගෙන යාමට තරම් ප්‍රමාණවත් වූයේ නැත. කෙනෙකුට අයිති වූ ප්‍රමාණය ඇතැම් විට වී සේරුවක් වැපිරිය හැකි තරමේ වපසරිය කි. ඒ එක්කම කලින් වගා කටයුතු ගැන තිබූ සමගියද බිඳ වැටුණි. අයෙක් වගා කළ අතර, අයෙක් වගා නොකර හැරියහ. තවත් අයෙක් පමා වී වගා කළහ. වතුර ගැනීමේ දී නොයෙක් හිරිහැර ඇති වුණි. වැට කඩොලු නොබැඳීමෙන් කුඹුරු පාළු වීය. ප්‍රතිඵලය වූයේ සමහර කුඩා වැව් යටතේ මුළු යායම වගා නොකර හැරීමයි. මේ හේතුව නිසා ලැබෙන වැස්සෙනුත් ප්‍රයෝජනයක් අත් වූයේ නැත.

කුඩා වැව් යටතේ මෙසේ පැවැති කුඹුරු යායවල් මේ තත්ත්වයෙන් ගොඩ ගැනීම භාර වූයේ මහඉලුප්පල්ලමේ කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානයට යි. පර්යේෂණ කිරීම උදෙසා ඔවුන් විසින් වලගම්බාහු වැව් ප්‍රදේශය තෝරා ගන්නා ලදී. මේ ප්‍රදේශයේ පැහැදිලිව දක්නට ලැබෙන ත්‍රිවිධ ගොවිතැන් ක්‍රමයක් ඇත. ගං ගොඩ හෙවත් නිවාස ආශ්‍රිත ප්‍රදේශය, සැතපුම් දෙකක් ඈතින් පිහිටි හේන් සහ වෙල් යාය හෙවත් වැවට ආසන්නව ඇති පහත් භූමියේ පිහිටා ඇති කුඹුර වශයෙනි. වියළි කලාපීය දේශගුණය, භූ-ලක්ෂණ, පස, සමාජ රටාව, වගා පිළිවෙත් මේ ආදී හැම අංශයකින් ම මේ ගැටළුවට විසඳුම් සෙවීම කළයුතු වූයේ ය.

යළි පිබිදෙන වළගම්බාහුව......

වළගම්බාහුව ව්‍යාපාරයේ ගොවි මහතුන් ඒ ගැන දක්වූ අදහස් උදහස් පහත පළවන ගොවි හමුවීම් වලින් ඔබ වෙත ඉදිරිපත් කිරීමට අදහස් කෙරේ. මේ උදෙසා අප මුලින් ම හමු වූයේ පරම්පරාවෙන් කුඹුරු ගොවියෙකු වන ජී. රන්නයිදේ මහත්මයා යි. (අප ඔවුන් හමුවූයේ යල කන්නය මැදහරියේදිය)

''රන්නයිදේ මහත්මයා, වලගම්බාහුවේ අළුත් වැඩ පිළිවෙළ සම්බන්ධව ඔබගේ අදහස් උදහස් ''ගොවි ජනතාව'' පාඨකයින්ට ඉදිරිපත් කරන මෙන් අප ඉල්ලා සිටිනවා.'' රන්නයිදේ මහතා කෙලින් ම විෂයට බැස්සා.

''වැවේ වෙල් යාය වැඩ කරන එක ගැන අප ගේ විශ්වාසය බිඳිලා තිබුණා. මේකට නොයෙක් හේතු තිබුණා. ඉන් එකක් වලගම්බාහු ගමේ ජනගහනය වැඩි වෙළා: ඒක නිසා කුඹුරු කැබලි වෙළා. ඉතින් වෙල් යායේ සංවිධානයක් ඇති කටයුතු කරන එක එන්ට එන්ටම අපහසු වුණා. වැවේ වතුර ගැන අරපරිස්සමක් නැති වුණා. ගොවීන් එකිනෙකා ගේ උවමනා එපාකම් ගැන ගරු සැලකිල්ලක් නැතිව කටයුතු කළා. අපේ දෙමාපියන් ගේ කාලේ තිබූ අන්දමට ගොවිතැන් කරන්ඩ පුලුවන් කමක් තිබුණෙ නෑ.

''ඉස්සර වැව පිරුණොත් විතරයි වෙල් යායේ ගොවිතැන් කරන්නේ. වැව ඒ අන්දමට පිරෙන්නෙ අවුරුදු හය හතකට සැරයක්. කන්නයක් හරි ගියොත් කන්න හත අටක් නැතිව යනවා. වෙල් යාය පාළු පිට්ටනියක් වෙලා තිබුණා.

''දැන් මේ ව්‍යාපාරය යටතේ සංවිධානයක් ඇතිව වැඩ කිරීමෙන් අපි හොඳ පල ප්‍රයෝජන ලබලා තියෙනවා. ආදි කාලේ රජදරුවො කියාපු අන්දමට වැවේ වතුර අපේ ධනය කියන එක ඒත්තු ගැන්නිලා තියෙනවා. ඉස්සර නම් කොච්චරවත් කැත්තයි, උඳල්ලයි කර ගහ ගෙන හේනාටමයි දුවන්නේ. දැනුත් හේන් කොටනවා. ඒත් වැව යටතේ ජලය අරපරිස්සමක් ඇතිව යොදා ගෙන වැඩ කිරීමේ ප්‍රතිඵල ලැබීම නිසා අනාගතය ගැන විශ්වාසයක් ඇති වෙලා තියෙනවා. ගොවි සමගියක් ඇති වෙලා තියෙනවා. ගමේ එකමුතු කමක් ආයෙත් ඇති වෙලා තියෙනවා. දැන් ගමේ ජීවත් වෙන එක සතුටක්.''

''හොඳයි, දැන් මේ ව්‍යාපාරයට ගමේ පවුල් කීයක් විතර සම්බන්ධ වෙලා කශයුතු කර ගෙන යනවාද?''

''වලගම්බාහු පුරාණ වෙල අක්කර 28 ක් විතර තිබෙනවා. මේකේ කොටස් අයිති පවුල් ගණන 40 – 50 ක් විතර ඇති. අළුතෙන් වගා කරපු තව අක්කර 30 ක් විතර තියෙනවා. අක්කර වෙලේ කාට කාටත් අයිති ඉඩම් ප්‍රමාණය පුරාණ වෙලට වඩා වැඩි යි. වගා කරන්ට පුළුවන් කන්නවල වැඩි උනන්දුවක් ගත්තෙ අක්කර වෙල වගා කරන්න. පුරාණ වෙලේ වැඩටත් අක්කර වෙලේ වැඩටත් වැවේ වතුර ගැනීම සම්බන්ධව නොයෙක් ප්‍රශ්න මතු වෙලා තිබුණා. එක් කෙනෙක් කලට වේලාවට වගා කරන කොට තව කෙනෙක් පමා වෙනවා. අරයා වේල්ල බඳින කොට මෙයා ඇවිත් ඒක කඩනවා. ඔං වාගේ. ඒකයි මං කියන්නෙ මේ ක්‍රමයෙන් ඔය කන්න තුනක් ගොවිතැන් කර ගන්න සලස්වපු එක විතරක් නොවෙයි, ගමේ ගොවිතැන් කටයුතුවල අපේ මුතුන් මිත්තන්ගෙ කාලෙ තිබුණ එකමුතු ගතිය නැවත ඇති වෙලා තියෙනවා කියලා. මේකට හොඳ අඩිතාලමක් වැටීමට ලැබෙන ආර්ථික වාසිත් හේතු වෙලා තියෙනවා. ඒ අංශය දුර්වල නම් මේ වාගේ ක්‍රමයක් සාර්ථක කර ගන්න එක ලෙහෙසි පහසු නෑ.''

''රන්නයිදේ මහත්මයා පසුගිය අවුරුද්දේ කරපු ගොවිතැන් කටයුතු ගැන විස්තරයක් කරන්න පුළුවන්ද?''

''ඔක්තෝම්බර් මාසෙ අපි බිම කැකුලමට හාල් වී ඉහිනවා. ඔක්තෝම්බර් 15 – 20 වන විට වැස්ස. මුළු ගොයමම පැහෙන්නේ අහස් වැස්සෙන් වැවේ වතුර ඉතිරි කර ගන්න. ගොයම කපන්නේ ජනවාරි – පෙබරවාරිවල.

''නැවත වතාවක් මාර්තුවල වැඩ පටන් ගන්නවා. මාර්තු 20 විතර වන විට වපුරලා ඉවරයි. කැකුලමට. වතුර මදි වුණ මේ වතාවේ දී වැවෙන් වතුර එක සැරයක් ලැබුණා. දැන් තියෙන ගොයම ජුනි මාසයේ කපනවා. ඒ එක්කම නැවත ඉඩම කොටලා එළවළු, කව්පි, උඳු දනවා.

''ඔල ගම්වල මගේ කුඹුරු අක්කර 12–15 ක් විතර තියෙනවා. ඒවායේ වැඩ පරණ පුරුදු විදියටමයි. සාමාන්‍යයෙන් මහ කන්නයේ අක්කර

9 ක් විතර වැඩ කර ගන්නවා. යලේ දී වැඩ කරන්නේ නැහැ. හේතුව, මේ වලගම්බාහුවෙ වගේ ජල පාලනයක් ඒ වායේ නැති එක. (මෙහෙ අක්කරයකට බුසල් 80 – 90 ක් විතර ලැබෙනවා.) වලගම්බාහුවෙ යල – මහ දෙකේම කන්නයකට බුසල් 60–70 ක් විතර ගන්නවා.

**"මොනවද වලගම්බාහුවේ ගොවිතැනට තියෙන බාහිර ප්‍රශ්න?"**

"වල් අලි, වල් ඌරන් කැකුලමට අපමණ පාළු සිද්ධ කරනවා. අපෙත් කුඹුරුවලට ළඟම අලි පාළු සිද්ධ කරනවා. වැට හොඳට බැන්දම මුවන්, ගෝනුන් එන්නෙ නෑ. අලියා ළපටි ගොයම පොඩි කර ගෙන යනවා. ගොයම පැහුනම පැහුණු කරල් කනවා."

## වෙල් යායට අලි බැහැලා . . .

වළගම්බාහුව වෙල්යාය මැදට ගිය අපට දක්නට ලැබුණා තැනින් තැන වංගෙඩි වළවල් හත අටක්. එතන ලියදිවල ඇවිද ඇවිද හිටපු ගොවි මහතෙක් එක්ක අප කතාවට වැටුණා. ඒ ගොවිමහත්මයාගෙ නම එම්. වස්තු නායිදේ.



"අද මමයි මුරේට පැල් රකින්නේ……"
(ඇම්. වස්තුනයිදේ ගොවි මහතා)

**"මොනව ද උන්නැහේ ඔය බල බලා ඇවිදින්නෙ**

"මහත්මයා මේ ඊයෙ රෑ අලි ජෝඩුවක් මේකේ ඇවිදලා, ගොයම් කාලා තියෙනවා. රෑ පැල් රකින ගමන් සද්දෙට විපරම් කරන කොට මම උන් ළඟට යනකම්ම කරුවලේ දැක්කෙ නැහැ මේ තියෙන්නේ වංගෙඩි අඩි වගේ අඩි පාරවල්.



"ඔය වංගෙඩි ඇවිද්ද වාගේ තියෙන්නේ……
ඊයෙ රෑ වල් අලි ගොයම් කන්ඩ ආවා……"
(පෙර දින පැල් රැක්ක ජී. රන්නායිදේ
ගොවි මහතා)

**"මේ යායේ කොච්චර කුඹුරු ඉඩම් මුන්නැහැට අයිති ද?"**

"මට අක්කර 2 ක් විතර තියෙනවා. අද මගේ මුරේට පැල් රකිනවා."

**'හොඳයි, මේ වළගම්බාහු ව්‍යාපාරය නිසා පෙනෙන්න විශේෂ දෙයක් තියනවාද?"**

"අද මේ යල කන්නය මැද හරියේ දවසක්. මේ ව්‍යාපාරය නිසා පුරාණ වෙලේ අක්කර 28 ම වගා කරලා තියෙන හැටි මහත්වරුන්ට දකින්නට පුළුවනි. නැත්නම් දකින්න හම්බ වෙන්නේ අපි අර පුරාණ විදියට වැවේ වතුර තිබෙන හැටියට අක්කර හත අටක 'බෙත්මක්' බෙදලා කුඹුරු වවන එකයි. ඉතින් ඔය කොටසට එන අස්වැන්නෙන් පවුල් 30 – 40 ක් මොනවා කරන්නද? අලුත් වැඩ පිළිවෙල හින්ද දූන් පහළ වැවේ පහුගිය අවුරුදු තුනේම පිරිල වාන දැම්මා.

**"හොඳයි, දූන් ඔය කියපු දේවල් වලට අමතරව අළුත් දැනුමක් ඔය ව්‍යාපාරය නිසා ලබා ගත්තා කියලා හිතනවා ද?"**

"ඔව්, අළුත් වැඩි දියුණු වී වර්ග හඳුනා ගැනීම, රසායනික පෝර භාවිතය, කෘමි නාශක, කන්න දෙකම කුඹුරු ගොවිතැන මේවා අළුතෙන් ඉගෙන ගත්තු දේවල්. ඉස්සර එක කාල සීමාවකට අයත් වී වර්ගයක් ඔක්කොම වැපුරුවේ නැහැ. දැන්නම් වැඩි දියුණු වී වර්ගමයි වපුරන්නේ.

**"දැන්, ඔක්කොම ගොවීන් මේ ක්‍රමය හොඳයි කියනවා. මේ ක්‍රමය ක්‍රියාත්මක කර ගෙන යන කොට ප්‍රශ්න හේම මතු වුනේ නැද්ද?" ක්ෂේත්‍ර නිලධාරී ධර්මසේන තෙන්නකෝන් මහතා ගෙන් අප විමසුවා.**

"ප්‍රශ්න නැති වෙන්නේ නැහැ. හැම ගොවියෙකුම එක වාගේ නො වෙයි. සමහර විට ඔවුන් සාධාරණ හේතු නිසා වගා පමා කරනවා. තවත් යමහරක් සාධාරණ හේතුවක් නැතිව පමා කරනවා. කොහොම වුණත් යායක් හැටියට කටයුතු කර ගෙන යන්නට හැම කටයුත්තක්ම කල් වේලා ඇතිව යායේ සිදු වන්න ඕන. නැතිනම් නොයෙක් ප්‍රශ්න මතු වෙනවා. පසුගිය කන්නයේ ගොවීන් පස් දෙනෙක් වගා කටයුතු පමා කළා. අපි ඔවුන්ට වතුර දුන්නේ නැහැ. අනික් අය ගොයම් කපන කොට ඒ අය ගේ කුඹුරුවල හීන්බන්ඩි. ඒත්, අපේ තීරණය පොදු යහපත උදෙසායි. ඒක වෙනස් කෙළේ නැහැ. මෙයින් අප බලාපොරොත්තු වන්නේ වගා කටයුතුවල දී ශික්ෂණයක් නැවත ඇති කිරීමටයි"

● ● ●

අවුරුදු තුන හතරකට ඉස්සර වළගම්බාහුවට යන විට පාර දෙපැත්තෙ දක්නට තිබුණෙ කටු ලඳු කැලෑව. පසුගිය ද අප එහි යන විට ඒ තත්වය එහෙම පිටින් ම වෙනස් වෙළා. රජයේ උදගම් දෙකක් නිසා පළාතටම එළිය වැටිලා. වළගම්බාහුව අසලම පිහිටා ඇත්තේ දයාගම. කේ. පියරත්න මහතා වළගම්බාහුවෙ නව පරම්පරාවට අයිති තරුණයෙක්. දැනට ඔහු උදගම් නායකයෙක් පසුගිය ද වළගම්බාහු වැවේ වෙල් යායේ ගොවියන් ගේ ඡන්දයෙන් වෙල් විදානේ තනතුරට ද පත් වුණා. ව්‍යාපාරයේ කටයුතු දැනට කර ගෙන යන නිලධාරීන් එම කටයුතු අවසන් කර ගිය විට ඉදිරියටත් එම කටයුතු පවත්වා ගෙන යාමේ කාර්ය භාර වන්නේ වෙල් විදානේ තැනටයි. දැනට වෙල් යායේ ඉස්මතු වන ප්‍රශ්න එකිනෙක ඔහු සඳහන් කළා.



වළගම්බාහු වෙල්යායේ වෙල් විදානේ තනතුරට පත් වී සිටින කේ. පියරත්න තරුණ ගොවි මහතා

"වෙල කොටස්වලට බෙදලා එක කොටසකට පැලක් බැගින් පැලවල් අටක් තනා තිබෙනවා. ගොවීන් මාරුවෙන් මාරුවට මුරකරනවා. නමුත් කිහිප දෙනෙක් තම වගකීම හරිහැටි කරන්නෙ නැහැ. ඒ අය නොයෙක් හේතු ඉදිරිපත් කර තම වාරය මහ හරින්නට හදනවා. මේකට ඉඩ දෙන්නට බැහැ.

"ගොවීන් අතරෙ පුරුද්දක් තිබුණෙ කන්නයක් ගොවිතැන් කරපුවාම කන්න දෙක තුනක් පස හැදෙන්නට අත් හරින එකයි. සමහරක් අය ඒ නිසා වැඩිමල් වියක් දමන්නට දැනුත් උත්සාහ ගන්නවා. නමුත් ක්ෂේත්‍ර නිලධාරීන්ගේ උදවු වෙන් ගොවීන් වැඩි දෙනාට කටයුතු කාරණා ඒත්තු ගන්නවා තියෙනවා. ඒ නිසා කෙටි කල් වී යොද කල් යල් බලා කන්න දෙකක් ගොවිතැන් කරන්න පුළුවනි.